# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 36 දරන
# ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

[සහතිකය සටහන් කළේ 1990 සැප්තැම්බර් මස 26 වන දින]

---

1990 සැප්තැම්බර් මස 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 36 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත.

[සහතිකය සටහන් කළේ 1990 සැප්තැම්බර් මස 26 වන දින.]

එල්. ඩී.—ඕ. 04/89

**ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය විසින් අන්තර්ග්‍රහණය කරනු ලැබුවාවූ ද විශ්‍රාම වැටුපකට හිමිකම් නොලැබුවා වූ ද කොළඹ වරාය කොමිෂන් සභාවේ සේවා නියුක්තයන්ට විශ්‍රාම වැටුප්වලට හිමිකම් ලබාගැනීමට හැකි කරවීම සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිසත් ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

**1.** මේ පනත 1990 අංක 36 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වරායවල් පිළිබඳ අධිකාරිය විසින් අන්තර්ග්‍රහණය කරනු ලැබුවා වූ ද ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 17 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලැබුවා වූ ද කොළඹ වරාය කොමිෂන් සභාවේ සේවා නියුක්තයන්ට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම.

**2.** 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 17 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් නොලබන තැනැත්තකු වන, (මෙහි මින් මතු "වරාය අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරියේ යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ කොළඹ වරාය කොමිෂන් සභාවේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශ කරනු ලැබ සහ ඔහුගේ සේවය කොළඹ වරාය කොමිෂන් සභාව යටතේ වූ සේවා කාලයට එකතු කරන ලද විට, ඒ සේවය අවුරුදු දහයක් හෝ ඊට වැඩි කාලයක් වන අවස්ථාවක, ඒ නිලධරයා හෝ සේවකයා අදාළ සේවා කාලය තුළ එම තනතුර දැරූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එම කාලය අවසානයේ දී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට ද ඔහු හිමිකම ලබන්නේ ය.

"අදාළ සේවා කාලය" මේ වගන්තිය අදාළවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන්, වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලයේ තනතුරකට ඒ තැනැත්තා පත් වූ දිනයෙන් පසුව කොළඹ වරාය කොමිෂන් සභාවේ දස අවුරුදු විශ්‍රාම වැටුප් සේවා කාලයක් සම්පූර්ණ කිරීම සඳහා, ඔහු එහි සේවය කළ යුතුව තිබූ කාලය අදහස් වේ.

විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි.

**3.** 2 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන සෑම තැනැත්තකුම—

(අ) වරාය අධිකාරියේ ස්ථිර සේවා නියුක්තියක් ඔහු විසින් භාරගනු ලැබූ විට, ගෙවන ලද යම් පාරිතෝෂිතයක්, ඔහු විසින් හෝ ඔහුගේ උරුමක්කාරයන් විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ආපසු ගෙවනු ලැබීමට;

2—ඩී 007582—5,710 (90/01)

(ආ) වරාය අධිකාරිය විසින් ඒ තැනැත්තා සේවයේ නියුක්ත කරන ලද දිනයෙන් ආරම්භ වී, මේ පනතේ 2 වන වගන්තිය යටතේ ඔහු විශ්‍රාම වැටුපකට හිමිකම ලැබූ හෝ ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා ඒ තැනැත්තා සම්බන්ධයෙන් වරාය අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලද සියලු දායක මුදල් කම්කරු කොමසාරිස්වරයා විසින් හෝ තම දායක මුදල් ඒ තැනැත්තාට ආපසු ලැබී ඇති විටෙක ඒ තැනැත්තා හෝ ඔහුගේ උරුමක්කාරයන් විසින් භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවනු ලැබීමිකට

යටත්ව, එම විශ්‍රාම වැටුප ලැබිය යුතු ය.

අනනුකූල තාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූල තාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.